State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

(Sinhala)

සිංහල භාෂාව හා සාහිත්‍යය - 1

(QUESTION PAPER) - I

ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
සිංහල භාෂාව හා සාහිත්‍යය - I
අ.පොෂ.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - **අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
  - **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
  - **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා පිළිපදින්න.**

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත කොටසෙහි අර්ථයට වඩා සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. සේතන් මුදලාලිට **<u>කණකොකා හඬලා</u>** යයි ගම්මු පැවසූහ.
   1) කණකොකා හඬළලා
   2) විනාශය ළං වෙලා
   3) වෙනස්කමක් වෙලා
   4) විනාශ වෙලා

2. ඇය **<u>භය හතර නොදන්නා</u>** ළදැරියක සේ ජීවත් විය.
   1) කිසිදු දෙයක් දන්නේ නැති
   2) කිසි කලබලයක් නැතිව
   3) දැනුම් තේරුම් නොමැතිව
   4) පාසලේ 6 ශ්‍රේණියට වත් නොගොස්

3. නිමල් සිය පවුල හා දෙමාපියන් සමඟ **<u>අත් වැල් බැඳගෙන</u>** ජීවිතය ගත කළේය.
   1) අත් දෙකින් අල්ලා
   2) තරහ මරහ අමතක කොට
   3) ඉතා පහසුවෙන්
   4) එකට එක් වී

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4.ගොවිතැන සඳහා පළමු වර ජල නිකුතුව ..... වේ.
   1) නානුමුරය
   2) දියකැපීම
   3) දියවර මංගල්‍යය
   4) දියබෙත්ම

5. විවිධ අරමුණු පසිඳුරන්ගේ මාර්ගයෙන් අපේ මනසට පිවිසීමෙන් විවිධ .....මැවේ.
   1) සංකල්ප රූප
   2) වාක් චිත්‍ර
   3) මනෝකාය
   4) කාව්‍ය සංකල්පනා

6. විදේශිකයන්ගේ පමණක් නොව ස්වදේශිකයන්ගේ ද නෙත්සිත් ..... කරගන්නා වෙරළ තීරයක් අප සතුය.
   1) වෛවර්ණ
   2) ආකර්ෂණීය
   3) සංක්ෂිප්ත
   4) උදාර

7. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි පද ගැළපූ වරණය තෝරන්න
   1) නා, නී, පියෙල, දොඹ
   2) පියෙල, දොඹ, නා, නී
   3) දොඹ, නා, නී, පියෙල
   4) පියෙල, දොඹ, නා, නී

8. අක්ෂර වර්ගීකරණය අනුව සාවද්‍ය පිළිතුර තෝරන්න.
   1) අ, ක, ඍ, හ - කණ්ඨජ අක්ෂර
   2) ඉ, ඊ, ය, ඣ- තාලුජ අක්ෂර
   3) ඎ, ඨ, ඩ, ණ - දන්තජ අක්ෂර
   4) උ, ප, බ, ම - ඕෂ්ඨජ අක්ෂර

9. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1) දණ්ඩන, දර්ශනපතය, සමස්තය දෘෂ්ටිය
   2) ප්‍රහල, මැතිඳාණ, සුරනර, සම්භාෂණය
   3) චන්දන, දන්ත, නිර්මාණ ඇබුල
   4) ප්‍රකාශන, රක්ෂණය, ඖෂධාලය, පුස්තකාලයීය

10. දීර්ඝ ඇදය, රකාරාංශය, ගයනුකිත්ත, රේඵය පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1) කුරුණෑගල, ග්‍රන්ථය, ගෞරවය, කර්‍මය
   2) කෘඹියා, පුස්තක, ඍණ, ධර්‍මය
   3) කූරටියා, භ්‍රමණය, පෞරාණික, කර්‍මය
   4) නැවියා, දුබල, ගෘහය, චර්‍මය

11. තද්ධිත පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
   1) බුද්ධිමත්, සිල්වත්, මොළකැටි, පුරාතන
   2) ස්වදේශීය, සුභදතා, දුබල, හැකියා
   3) පොඩිත්, සෞන්දර්යය, නැටුණු, කාලීන
   4) වරලස්, ඉහටිය, බැලුම්, ජනතා

12. උපසර්ග පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
   1) අභිලාෂය, කුසලතා, සුවිශේෂ, දුදන
   2) අවසඳ, නිර්මාණ, ප්‍රබල, නයන
   3) අදිපති, දුර්ජන, පරදේශ, ප්‍රතිවිපාක
   4) විමල, උපවන, ගැයුම්, පැවතුම්

13. පරරූප, ආගම, පරස්වරලෝප, ද්විත්වරූප යන සන්ධි සඳහා ගැළපෙන පිළිතුර වන්නේ
    1) දඬුවම්, සුරත, අස්සන, වැද්දා
    2) වටොර, දෑල, විස්සම්, කටුවල
    3) තප්පර, වියවුල්, බුදුකුරු, කුරුල්ලා
    4) උපනූපන්, පිළිතුරු, සතුරා, මහේසිකා

14. නිවැරදි විසන්ධිය ඇති පද පේළිය තෝරන්න.
    1) ගෙන + ආවා, අනු + උත්, සුර + අඟන, සිත් + කරු
    2) හිඟුරු + අල, බිය + ඇති, නුවන් + අග, පස් + සාලිස්
    3) කටු + අල ,නැව් + අයාට, ගඟ + තෙර, ලිප් + ගල
    4) වල් + ඌරා, උගත් + තෝ, ගෙත් + කම්, සු + අසු

15. 'තාරා' හා 'නට' යන පද දෙක අයත් වන්නේ
    1) නාම පද හා ධාතු ප්‍රකෘති
    2) නාම හා ක්‍රියා පද
    3) නාම ප්‍රකෘති හා ක්‍රියා පද
    4) නාම ප්‍රකෘති හා ධාතු ප්‍රකෘති

16. <u>අහසින්</u> තරුවක් කඩා වැටෙනවා
    දන්නෝ <u>බුදුන්ගේ</u> ශ්‍රී ධර්මස් කන්ධා
    <u>පුතුනේ</u> මේ අහගන්න
    <u>පුෂ්පයෙන්</u> වන සුන්දර වේ ලංකෘත වේ

ඉහත ගීත ඛණ්ඩයන්හි ඉරි ඇඳි පද අයත් විභක්ති අනුපිළිවෙළින් දැක්වෙන්නේ
    1) අවධි, ආධාර, සම්ප්‍රදාන, ආලපන
    2) අවධි, සම්බන්ධ, ආලපන, කරණ
    3) අවධි, සම්ප්‍රදාන, ආලපන ,කර්ම
    4) අවධි, සම්බන්ධ, ප්‍රථමා, කර්ම

17. ඇය <u>හඬමින්</u> නිවසට ගියාය.
    <u>බල</u> මහ මුහුද අව සඳ උතුරින් පෙනෙන
    සතුරන් එනු <u>බලා</u> ඔහු සටන් බිමට ආවේය.
    <u>කියත</u> උන් මෙතෙපල

ඉහත ඉරි ඇඳි පද අයත් ක්‍රියා පද අනුපිළිවෙළින් දැක්වෙන්නේ
    1) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
    2) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා
    3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
    4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

18. "ආකාශයේ පිපී වැනී ගිය තරු කාලයක් සේ පිරිවරා සිටින රහත් පෙලකින් හා පුන් සඳු සේ දිලිසෙන ස්වාමි දරුවාණන් ගේ ශ්‍රී විභූතිය දැක"
ඉහත උපුටනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ
    1) බුදුන් වහන්සේ තරුවටත් රහත් පෙළ සඳටත් උපමා කරයි.
    2) බුදුන්වහන්සේ තරුවටත් රහත් පෙළ සඳටත් රූපක කරයි.
    3) අහසේ තාරකා සමූහයට රහත්පෙල උපමා කරන අතර බුදුන් වහන්සේ සඳට රූපක කරයි.
    4) අහසේ තාරකා සමූහයට රහත් පෙළ උපමා කරන අතර ම සඳුට බුදුන් වහන්සේ උපමා කරයි.

19. '**සබවස කුලුණු මෙත් මුදිතා** දහම් සැම' යන පද්‍ය පාඨයෙහි කළු කර ඇති පදයන්හි නිවැරදි අර්ථ විවරණ අනුපිළිවෙල දැක්වෙන්නේ
    1) සත්‍ය, මෛත්‍රිය, කරුණාව, මුදිතාව
    2) සත්‍ය, කරුණාව, මෛත්‍රිය, මුදිතාව
    3) යහපත් වචනය, කරුණාව, මෛත්‍රිය, මුදිතාව
    4) සත්‍ය වචනය, කරුණාව, මෛත්‍රිය, මුදිතාව

20. A. කියන්නා
    B. කියනු
    C. රකින්නෝ
    D. රකින
ඉහත දැක්වෙන පද අතරින් කෘදන්ත නාම පමණක් දැක්වෙන්නේ
    1) A හා C
    2) B හා D
    3) A හා D
    4) B හා C

21. සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න
    1) භවය - ජාතිය, ප්‍රාර්ථනා - පැතුම්, තදින් - තර, විළිය - ලැජ්ජාව
    2) රුහිරු - ලේ, පද්ම - නෙළුම්, රුවන් - රත්නන්, සින්ධූපමාන - සාගරය තරම්
    3) සක්වල - චක්‍රාවාටය, සූර්යයා - දිනකර, ගස් - ධූම, කාන්තාව - දිගැසි
    4) අහස - නබෝගැබ, නිවස - ගෘහය, නෙලුම් - අරවින්ද, ජලය - පැන්

22. විරුද්ධාර්ථ පද යුගලයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
    1) සුසිරිත - දුසිරිත
    2) ඌන - අනූන
    3) ස්වාධීන - පරාධීන
    4) දේශීය - ස්වදේශීය

- 23,24,25 වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

23.
    1) ඔවුහු ක්‍රීඩකයන් වෙති
    2) ඔහු කවියෙක්
    3) අපි සියල්ලන්ම නළුවෝ වෙමු
    4) දරුවන් අවංක නොවන්නේ ඇයි?

24.
    1) සිසුහු ක්‍රීඩා පිටියට පැමිණ නැත.
    2) මා ඒ පොත කියවා ඇත්තෙමි.
    3) ඔෆ තොමෝ ගමට ගියහ.
    4) ගුරුවරු රැස්වීමේ ඇත.

25.
    1) සතුරෝ පහර දෙති'යි ගම්වැසියෝ බිය වූහ.
    2) දේශපාලනඥයෝ හා මිනිස්සු රැස්වීමට ආහ.
    3) අපි ශිෂ්‍යයෝ හා කතා කළෙමි.
    4) මව හෙවත් අම්මා දරුවන්ට බත් බෙදා දෙති.

26. පහත දැක්වෙන පද යොදා හිස්තැන් පිරවීමේ දී නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

A. ඉක්බිති B. විරූ C. විනා D. මැනවි

- දෙවියන් ..... මට පිළිසරණක් නැත.
- ඔබ අපට සමාව දුන .....
- ..... සියල්ලෝම විසිර ගියහ.
- පෙර නොවූ ..... සටනක් කළ යුතුව තිබේ.

1) C,D,A,B
2) B,C,D,A
3) A,B,D,C
4) D,C,B,A

27. අය මාර්ග මුළුමනින්ම විනාශ කර දැමීම යන්නට ගැළපෙන පිරුළ වන්නේ
1) ඌරෝ කවද ද කහ කෑවේ
2) වක්කඩේ හකුරු හැංගුවා වගෙයි
3) අතු කඩා මොර කන්නා සේ
4) අලි මදිවට හරක්

28.“එගොඩ ගොඩේ උල ලේනා හඬන්නේ” යන කවි පදයෙහි අර්ථය නිවැරදිව දැක්වෙන්නේ
1) උල ලේනෙක් හඬන බව
2) ගැමියන්ගේ බලාපොරොත්තුවක්
3) මරණයක් සිදුව ඇති බව
4) අසුභ ආරංචියක පෙරනිමිත්තක් බව

29. “අපි විද්වතුන් දකිමු” යන වාක්‍ය කර්මකාරකයට හැරවීමේදී නිවැරදි වන්නේ
1) අප විසින් විද්වතුන් දැක්කෙමු.
2) අප විසින් විද්වත්හු දකිනා ලදහ.
3) අප විසින් විද්වත්තු දැකෙති.
4) අප විසින් විද්වත්තු දක්නා ලද්දෝය.

30. පහත සඳහන් ‘අ’ සහ ‘ආ’ කොටස් දෙකෙහි අතීත ව්‍යවහාරයන් හා සංඛ්‍යා ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ

අ		ආ
1.	සොළස	A. 16
2.	එකුන් තිස	B. 14
3.	තුදුස	C. 29
4.	තෙළෙස	D. 17

1) 1 – A
2) 2 – B
3) 3 – C
4) 4 – D

31. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත පිළිතුර තෝරන්න.
1) උපමාවාචී නිපාත - එව්, බඳු, විලස්, මෙන්
2) ශීඝ්‍රාර්ථයේ නිපාත - වහා, සේද, හනික, යුහුව
3) සීමා අර්ථයෙන් නිපාත - තෙක්, තුරු, සෙට, දක්වා
4) පද සම්බන්ධ කිරීමේ නිපාත - හා, සහ, සමග, කැටුව

32. "උඹ මිනිහෙක් වෙයන් පුතේ
කුසගිනි වෙයි එකම සතුරු" මෙම ගීත ඛණ්ඩය ඇතුළත් නාට්‍ය වන්නේ
1) සිංහබාහු නාට්‍යය
2) හුණුවටයේ කතාව
3) මනමේ නාට්‍ය
4) පේමතෝ ජායතී සෝකෝ

33. නිවැරදිව ගැලපෙන පද යුගල තෝරන්න.

A.	හැන්දිරාල	E.	ඔරු අයිති කරුවා
B.	ඉල්ලම් කූර	F.	ඉල්ලම
C.	මහ එක	G.	අලියා
D.	ගඟුල බානවා	H.	හානවා

1) A-F, B-G
2) A-E, C-G
3) C-F, D-E
4) B-H, C-E

34. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නගර නාමය නිවැරදිව ඇතුලත් වරණය තෝරන්න.
1) අරනාරපු
2) දෙණි - දඹ
3) පහුවයා
4) මනුවර

35. හංස සන්දේශය හා සැළලිහිණි සංදේශය කතුවරුන් නිවැරදිව දැක්වෙන්නේ
1) අලගියවන්න මුඛවෙටි හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
2) වීදාගම මෛත්‍රී හිමි හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
3) දෙවෙනි පරාක්‍රමබාහු රජු හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
4) වීදාගම ගුණානන්ද හිමියෝ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

36. I කොටසේ ඇති රූඩි පද සඳහා II කොටසේ නොගැළපෙන අර්ථය සහිත වරණය තෝරන්න.

A.	කඹ අදිනවා	E.	ක්‍රියාත්මක නොකිරීම
B.	සුදුහුණු ගානවා	F.	වැරදි වසන් කිරීම
C.	බඩට ගහනවා	G.	ආහාර නොදීම
D.	තරු පෙනෙනවා	H.	කරදරයට පත් වීම

1) A හා E
2) B හා F
3) C හා G
4) D හා H

37. පහත වාක්‍ය තුළින් අදහස නිවැරදි ව දැක්වෙන වාක්‍ය තෝරන්න.
1) සිංහල අක්ෂර මාලාවේ ප්‍රාණාක්ෂර විස්සකි.
2) ඍ,ඎ යන අක්ෂර වර්තමානයේ භාවිතයේ නොයෙදෙයි.
3) නිපාත උපසර්ග යනු ප්‍රත්‍යයාර්ථ නාම වේ.
4) කර්තෘ කාරක වාක්‍යක කර්ම පදය අනුක්ත වේ.

38. කහකුරුල්ලා අත්තෙහි හිඳියි.
පාළු නිවසෙහි වේපස්සු ඇත.
ගුළුගොනගුල් තුරු හිස් මත සැරි සරයි.
ඉර සඳු යන ස්වභාවික වස්තූන් පුරාණයේ දේවත්වයෙන් සලකා ඇති බව පෙනේ.

මෙහි ඉරි ඇඳි පද අයත් සමාස අනුපිළිවෙල දක්වා ඇති වරණය තෝරන්න.
1) විශේෂණ, විභක්ති, අන්‍යාර්ථ, දකාරාර්ථ
2) විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ, දකාරාර්ථ
3) දකාරාර්ථ, විභක්ති, විශේෂණ, අන්‍යාර්ථ
4) විශේෂණ, අන්‍යාර්ථ, විභක්ති, දකාරාර්ථ

39. පහත සඳහන් කවිය අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වර්ණය තෝරන්න.
නො වි ත ර තෙද බලැති මහතුන් හට පවර
වැ ර සැ ර නො වන නුනුවණ දන බඳිනු වෙර
තු භු ත ර ගිරි පපන දළ දළඹින් පැහැර
ම ත ව ර ගිජිඳුට පෙදෙනැත වෙහෙසෙන අයුර

1) මහතුන්ට වෙර බැඳීම මත් රජෙකුට වෙහෙසුනා වැන්න
2) උතුම් වීරසාර ගුණ ඇති මහතුන් පරාජය කළ නොහැකි බව
3) අප්‍රමාණ තේජස බලය ඇති උතුම් මහතුන්ට නුවණින් අඩු මිනිසුන් වෛර බැඳීම විශාල පර්වත දැඩි දළ අඟින් පහර දෙන මත් ඇතෙකු පයින් ඇන වෙහෙස ගන්නාක් වැනි බව
4) උතුම් මහතුන්ට නුවණින් අඩු මිනිසුන් වෛර බැඳීම ප්‍රයෝජනයක් නොවන බව

40. "හිමි ඔබ සයුර මැද රුදු සටනකය රැයේ" යන පද්‍ය ඛණ්ඩයෙහි සමීප අර්ථය දෙන වර්ණය තෝරන්න.
1) ස්වාමියා සයුර මධ්‍යයේ සිටින බව
2) ස්වාමියා රාත්‍රියේ සයුරෙහි සිටින බව
3) ස්වාමියා සටනක නිරත වන බව
4) ස්වාමියා රාත්‍රියේ සයුර මධ්‍යයේ දරුණු සටනක යෙදෙන බව

State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

(Sinhala)

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

(QUESTION PAPER) - II

ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
සිංහල භාෂාව හා සාහිත්‍යය - II
අ.පොෂ.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.**

1. අංක (i) සිට (x) තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i)සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් පහත සඳහන් අක්ෂර අයත් වන කාණ්ඩ දෙක නම් කරන්න.
(අ) ඓ, ඕ
(අ) ප, ඵ, බ, භ, ම

(ii)පහත සඳහන් පද සඳහා ගැළපෙන විරුද්ධාර්ථ පද ලියා දක්වන්න.
(අ) ස්වාර්ථය
(ආ)ළෙන්ගතු

(iii)පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) ඔවුහු ඉතා හොඳින් ගීත ගයති.
(ආ)අපි ඉතා භක්තියෙන් පුද පූජා පැවැත්වූයෙමු.

(iv)පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේද ලියන්න.
(අ) ගවුම්පොඩිය
(ආ)බඹසුරනර

(v)පහත සඳහන් පද විසන්ධි කර දක්වන්න.
(අ)අවස්ථෝචිත
(ආ)අභ්‍යුදය

(vi)පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හා දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවෙනි වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.
(අ)මහාවාලුකා ගඟ
(ආ)ප්‍රතිමා ගෙය

(vii)පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ඒ හඬින් තුෂ්ණිම්බූත වූ ගම්මු පිළිවෙලට කළ වැඩ අත්හැර දමා පලා ගියහ.

(viii)පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) මලු (ආ) මළු

(ix)පහත සඳහන් වාක්‍යවල ඇතුළත් තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා පද වර්ගය ලියා දක්වන්න.
(අ) **බල** සුබ නිමිති පෙරමඟ නැකතටත් වැඩී
(ආ)මගේ අම්මා මට හීනෙන් **පෙනීයන්**

(x)පහත සඳහන් වාක්‍ය සදොස් ය. නිදොස් කර ලියන්න.
(අ)සොල්දාදුවෝ සටන් කරද්දී සතුරෝ පැන දිවූහ.
(ආ)ශිෂ්‍යයෝ හොඳින් උගත යුතු ය.

(ලකුණු 2 x 10 = 20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ වඩාත් ඔසවා තැබිය හැකි රාජ්‍යයෙකි. එහෙත් වර්තමාන තත්ත්වය එසේ නොවේ. විශේෂයෙන් ලංකාවට ආවේණික කර්මාන්ත රැසක් ඇත. ඒ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු වන්නේ නම් රැකියා සම්පාදනය, විදේශ විනිමය ඉපැයීම, පරිසර සුරක්ෂිතතාව වැනි අංශ ගණනාවක් ම ජය ගනු ඇත. දේශීය රෙදිපිළි නිෂ්පාදනය, ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය ආශ්‍රිත උපකරණ එනම් වේවැල්, පොල්කටු, තල්පත් ආදී තවත් බොහෝ දේ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කර රට දියුණු කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) සමස්ත ලෝකය ම කොරෝනා හෙවත් කොවිඩ් 19 නැමති දරුණු බෙදවාචකයට මුහුණ දී තිබේ. ඒ පිළිබඳ විමසුම් ඇසින් බැලූ කල්හි ස්වභාවධර්මය ලබාදුන් තත්ත්වයන් නොව ඒ සියල්ල මිනිසා විසින්ම නිර්මාණය කළ තත්ත්වයන් බව පෙනේ. තාක්ෂණය, විද්‍යාව කොතරම් දියුණු යැයි පැවසුව ද ඒ එක් ආංශික දියුණුවක් පමණි. එබැවින් පරිසරය රැකෙන දියුණු වැඩපිළිවෙළකට මුළු ලෝකය ම ප්‍රවේශ විය යුතු ය. මිනිසුන් ලක්ෂ ගණන් බිළිගනිමින් පැතිරෙන වසංගත පවසනුයේ අනාගත ව්‍යසනයක පෙරනිමිති නොවේද? එබැවින් මිනිස් ක්‍රියාකාරකම් සියල්ල පාරිසරික හිතකාමී ඒවා විය යුතු ය.

(ඉ) මෙරට අධ්‍යාපන ක්‍රමය පිළිබඳ විවිධ අදහස් සමාජගත වී තිබිණි. අධ්‍යාපනයට සුදුසු රැකියාවක් නැතැ'යි ඇතැමුන්ගේ මතය යි. රැකියාවට සුදුසු අධ්‍යාපනයක් නැතැ'යි තවත් කෙනෙකුගෙ මතය යි. එබැවින් මෙම චෝදනාව නොවන්නට කළ යුත්තේ රටේ, ලෝකයේ දිශානතිය හඳුනා ගෙන ඒ සඳහා වූ අධ්‍යාපනික ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීම යි. ඉන් ප්‍රකාශ වන්නේ කලාව, ඉතිහාසය, පුරාවිද්‍යාව වැනි ක්ෂේත්‍ර නූගැන්විය යුතු බව නොවේ. ඒ සඳහා සුවිශේෂී ස්ථානයක් ද ලබා දිය යුතු ය. සැබැවින් ම අධ්‍යාපන කළමනාකරණය විය යුතු ය.

(ඊ) අනතුරු පිළිබඳ කතාබහ නිමාවක් නොවන්නකි. විශේෂයෙන් මහා මාර්ගය ආශ්‍රිත රිය අනතුරු දිනෙන් දින ඉහළ යයි. රට පුරා මාර්ගවල වාහන සංඛ්‍යාවේ වැඩිවීම වේගවත් ය. රියදුරු බලපත්‍ර ලබාගත් මෙන් ම නොගත් අය ද බහුල වශයෙන් මහා මාර්ගය භාවිත කරනු පෙනේ. මෑත කාලයේ සිදු වූ රිය අනතුරුවලින් අහිමි වූ ජීවිත ගණන ඉතා ඉහළ අගයක් ගනී. අධිවේගී මාර්ග ඉදිවීමට සමගාමී ව සෙසු සාමාන්‍ය මහාමාර්ග ද සංවර්ධනය විය යුතු ය. මාර්ගයට දරාගත හැකි පමණින් වාහන භාවිත විය යුතු ය. මේ සියල්ල නිසිලෙස පාලනය වේ නම් අනතුරු අවම කරගත හැකි වේ.

(ලකුණු 25)

03.පහත දැක්වෙන පාඨය වචන 55 - 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

පරිසරය සුරැකීම සඳහා ගතයතු පියවර ඉතා පැහැදිලි ය. ඒ සඳහා ජනතාව දැනුවත් කිරීමත්, නෛතික රාමුව ශක්තිමත් කිරීමත් අවශ්‍ය අවශ්‍ය ය. එක් එක් රටවල් තනි තනි ව ගනු ලබන ක්‍රියා මාර්ගයන් මෙන් ම ලෝක ප්‍රජාව සාමූහික ව ගනු ලබන ක්‍රියා මාර්ගයන් ද එක සේ ම මේ සඳහා වැදගත් වනු ඇත. ස්වභාවික සම්පත් තිරසාර ලෙස යොදා ගැනීම මෙන් ම සංරක්ෂණය කිරීම, වනගහනය වර්ධනය කිරීම ඒ සඳහා අලුතින් ගස් වැවීම, කාර්මික අපද්‍රව්‍ය පාලනය කිරීම හා කළමනාකරණය, පරිසර දූෂණය පාලනය කිරීම, ජීවීන් රැක ගැනීම, වනජීවීන් රැක ගැනීම, කාබනික පොහොර භාවිතය, රසායනික පොහොර භාවිතය හැකිතාක් දුරට අඩු කිරීම, ජනගහනය පාලනය කිරීම, පරිසරයට ආදරය කිරීම හා පරිසරය සුරැකීමට ජනතාව විශේෂයෙන් ම තරුණ පිරිස් දැනුවත් කිරීම් ආදිය පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය හිමි විය යුතු කරුණු වශයෙන් පෙන්වා දිය හැකිය. එක් අතකින් පරිසර විනාශය හා පරිසර සුරැකීම අතර අභියෝගයකට මිනිසා මුහුණ දී සිටී. තවත් අතකින් ජනගහන වර්ධනය හා තිරසාර සංවර්ධනය අතර අභියෝගයකට ද මිනිසා මුහුණ දී සිටී. පරිසර මිත්‍රශීලී තිරසාර සංවර්ධන උපාය මාර්ගයක් තුළින් ජනගහන වර්ධනය පාලනය කර ගනිමින් ආර්ථික සංවර්ධනයක් ලබා ගන්නේ කෙසේද යන්න වත්මන් ලෝකය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝගය යි. එම අභියෝගය ජය ගැනීම තුළින් පමණක් අපට පරිසර හානි වළක්වා ගත හැකි බව පැහැදිලි ව පෙනේ. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

බුදු පිලිමය ලංකාවේ නිර්මාණය වී තිබුණු බවට වංශකතාගත සාධක පැවති මුල් අවධියේ දී ම ලංකාවේ ද බුදුන් වහන්සේ උදෙසා සංකේත වන්දනාව පැවැති බවට පුරාවිද්‍යාත්මක සාධක වේ. විශේෂයෙන් ම බුදුරජාණන් වහන්සේගේ අසීමිත බුද්ධ ගුණය හා රූපකාය මූර්තිමත් කරන නිර්මාණයන් කළ නොහැකි යැ'යි විශ්වාස කරන ලද ථෙරවාදීහු බුදුරජාණන් වහන්සේ වන්දනා සඳහා සංකේත ඉදිරිපත් කළ බව සිතීමට පුළුවන. සාංචි, බාර්හුත් කැටයම්වල බුදුරජාණන් වහන්සේ සංකේතවත් කිරීම සඳහා යොදාගෙන ඇති සංකේත අතරින් වජ්‍රාසනය හා සිරිපතුල් යුවළ, මෙරට මුල් ම යුගයේ බුදුන් වහන්සේ වෙනුවට සැදැහැවතුන්ගේ වන්දනාවට පාත්‍ර වූ සංකේත දෙකක් ලෙස සලකනු ලැබේ. බුද්ධ ප්‍රතිමා රහිත වජ්‍රාසනයෙන් යුතු ආසනඝර නිර්මාණය වූ බවට සාධක වේ. නිදසුන් වශයෙන් අනුරාධපුර අභයගිරි විහාරභූමියේ ඇති ආසනඝරය සහ මඩකලපු දිස්ත්‍රික්කයේ පුළුකුණාටියේ පිහිටි ආසනඝරය ද දැක්විය හැක. මෙම ආසන වන්දනයට වඩා සිරිපතුල් වන්දනය ජනප්‍රිය වූ බව සිතිය හැකි වන්නේ සිරිපතුල් සංකේත දිවයිනේ විවිධ පළාත් වලින් ලැබී තිබෙන බැවිනි. මේවා සිරිපතුල් ගල් ලෙස හඳුන්වනු ලැබේ. මෙම සිරිපතුල්වල අෂ්ඨමංගල ලක්ෂණ ඇතුළු මංගල සංකේත රාශියක් යොදා තිබේ. නමුත් වැදගත් කාරණය වනුයේ ඉහත සඳහන් සංකේත වන්දනය මෙයට සමකාලීන ව ම තවදුරටත් විකාශනය වූ බුද්ධ ප්‍රතිමාවක් ලෙස කෙටි කාලයකින් ම ශ්‍රී ලංකාව තුළ ඉදිරිපත් වී ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක වලින් පැහැදිලි ය.

i) " සිරිපතුල් ගල් "ලෙස නම් කෙරෙන සංකේතවල විශේෂ ලක්ෂණය කුමක් ද?
ii) මුල් යුගයේ දී බුදුන් වහන්සේ වෙනුවට වන්දනාවට පත්වූ සංකේත දෙකක් නම් කරන්න.
iii) "ආසනඝර" දැකිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න.
iv) අසීමිත බුදු ගුණය පිළිබඳ ථෙරවාදීන්ගේ ආකල්පය මෙහි සඳහන් වන්නේ කෙසේ ද?
v) සාමාන්‍ය ජනතාව අතර වඩාත් ජනප්‍රියත්වයට පත් වන්දනා සංකේතය වූයේ කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

05. ඔබ ප්‍රදේශයේ "සමගි පුස්තකාලය" ට නව සාමාජිකයන් බඳවා ගැනීම මේ දිනවල සිදුවේ. ඒ පිළිබඳ තොරතුරු කිහිපයක් මෙසේ ය.

- නව සාමාජිකයන් සඳහා "සුහුරු සාමාජික ප්‍රවේශ පත්‍රයක්" (Smart Membership Card) නොමිලේ.
- ග්‍රාම සේවා සහතිකය අනිවාර්ය යි.
- මව/ පියා/ භාරකරුගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය
- ඇතුළත් වීමේ ගාස්තුව රු. 400කි.
- පිටතට ගෙන යා හැකි පොත් සංඛ්‍යාව 4 ක් දක්වා ඉහළ දමා ඇත.
- බඳවා ගැනීමේ කාලය මාර්තු 20-27 දක්වා වේ.
- සතියේ දිනවල උදේ 9.00 - සවස 4.00 දක්වා විවෘතය.
- සෙනසුරාදා/ඉරිදා/ පෝය දින/ රජයේ නිවාඩු දිනවල පුස්තකාලය වසා ඇත.

ඉහත තොරතුරු ඇතුළත් කරමින් ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් පිළියෙළ කරන්න.

නැතහොත්,

මුළු ලෝකයට ම තර්ජනයක් වී ඇති කොරෝනා හෙවත් කොවිඩ් 19 රෝගය හේතුවෙන් ලක්ෂ 6 ඉක්මවා ලෝකවාසී ජනතාව මිය ගොස් ඇත. බොහෝ විට මේ තත්ත්වයට හේතු වී ඇත්තේ මහජනයාගේ නොසැලකිල්ල හා නොදැනුවත්බවයි. කොතෙක් දැනුවත් කළ ද ජනයා ප්‍රමාණවත් අනුකූල බවක් නොදක්වයි.

මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රයක් සකස් කරන්න. ඔබ, කොළඹ දිසාව භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා/ තුමිය බව සිතා පිළියෙළ කරන්න.

(ලකුණු 15)

State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පොෂ.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

(Sinhala)

සිංහල භාෂාව හා සාහිත්‍යය - III

(QUESTION PAPER) - III

ප්‍රශ්න පත්‍රය - III



අනුග්‍රහය :

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය
සිංහල භාෂාව හා සාහිත්‍යය - III
අ.පොෂ.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.**

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පියසන් නො ව බිඟු දැල් රැඳි කොපුලී
.....
.....
ගජසෙන් සිතියම් ගජ සිරි කියෙලී

(අ)මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි ඇතුළත් සමූහාර්ථවාචී පද දෙකක් ලියන්න.

(ii) (අ)කෙළි සෙල්ලම් ආශ්‍රිත ව නිර්මාණය වූ ජනකවි ප්‍රභේද දෙකක් ලියන්න.
(ආ) දෙවියන් උදෙසා පුද පූජා පවත්වද්දී ජනයා යොදාගත් කවි වර්ග දෙකක් ලියන්න.

(iii)"ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව'යි කීහ."
(අ)මෙසේ පැවසුවේ කවු ද?
(ආ) කුරුණෑගල යුගයේ රචනා වූ බවට සැලකෙන පද්‍ය කාව්‍ය කෘතියක් නම් කරන්න.

(iv) (අ)ලෙනාඩ් වුල්ෆ් මහතා ශ්‍රී ලංකාවේ තම රාජකාරිය කළ දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
(ආ)The Monkey(ද මන්කි), Savage Sanctuary(සැවේජ් සැන්චුවරි) යන කෘතිවල කතුවරුන් දෙදෙනා කවුරුන් ද?

(v)"රිසි නොවීද මා පියාට වාසෙ මාලිගේ"
(අ)මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා පිදුම් ලැබූ සම්මාන දෙකක් නම් කරන්න.

(vi) (අ)එස්. මහින්ද හිමියන් මෙරට දී පැවිද්ද ලැබූ නිකාය දෙක නම් කරන්න.
(ආ)'ජාතික තොටිල්ල' පැදි පෙළ අයත් වන්නේ කුමන තේමාවක් යටතේ ලියන ලද කවි වර්ගයකට ද?

(vii) (අ)සිංහල කතා කලාවේ සංක්ෂිප්ත රීතිය නිරූපණය කරන කෘතිය කුමක් ද?
(ආ)මෙම කෘතිය රචනා වූ යුගය කුමක් ද?

(viii) (අ)සිංහල සාහිත්‍ය වංශයේ දැනට දක්නට ඇති පැරණිතම සන්දේශ කාව්‍ය කුමක් ද?
(ආ) එය රචනා වූයේ කුමන යුගයේ ද?

(ix) (අ)එච්. එම්. කුඩලිගම කවියා සේවය කළ පුවත්පත් දෙකක් නම් කරන්න.
(ආ) කොළඹ II කවි යුගය දීප්තිමත් කළ කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(x) (අ)සාමණේර භික්ෂූන් සඳහා වන විනය නීති සංග්‍රහ දෙකක් නම් කරන්න.
(ආ)'කාව්‍යාදර්ශ' නම් අලංකාර ග්‍රන්ථයේ සිංහල අනුවාද ග්‍රන්ථයේ නම කුමක් ද?

2.පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i)පවන'ද පිපි තුරේ ය නිර තුරේ ය
කුසුමන් පෙති තුරේ ය මළු තුරේ ය
අවට සුපිපි සරේ ය බිඟු සරේ ය
සිත එවෙහෙර කෙරේ ය ලොබ කෙරේ ය
(අ)ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථ පිළිවෙළින් ලියන්න.
(ආ) සුන්දර වටපිටාව ගැන දක්වා ඇති අදහස එක් වාක්‍යයකින් ලියන්න.

(ii)"... මා උපන්තැන් පටන් - ගෙනැ දැනැ සතක්හු දිවි නො ගැලවී නම් ඒ සසින් තිටදු හබට දු සෙත් වේව'යි සස් කරා'යි .."
(අ)මෙසේ පවසන්නේ කවු ද? කාහට ද?
(ආ) මෙය ඇසූ තැනැත්තා ගේ පිළිතුර වූයේ කුමක් ද?

(iii)රැති වන පෙතිනැවිදින් සුමුවෝයා
නිති මියුරැති වෙණ නද ළමුවෝයා
සිතුවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා

(අ) ඉරි ඇඳි පදවල තේරුම් වෙන් වෙන් ව ලියන්න.
(ආ) වීණාවාදනයේ මිහිරියාව සමග සිදු වූ අපූර්වත්වය මෙම කවියේ දක්වා ඇති ආකාරය කෙටියෙන් දක්වන්න.

(iv)"... එහෙත් හය මසකට පමණ පසු යළිත් ඔහු ගෙදරට පාත් වූ කල ගැලවීගත හැකි වූයේ නොවදින වැදුම් වැඳ, කෙසේ හෝ තව සති දෙකක්..."
(අ)මෙහි සඳහන් කරුණ කුමක්දැ'යි කෙටියෙන් දක්වන්න.
(ආ) මෙම නිලධාරියා මාස හයකට පසු පැමිණීම මගින් ඔහුගේ කවර ලක්ෂණයක් ඉස්මතු වේ ද?

(v)'මේ රජ්ජුරුවන්ට මා මුත් අනෙක් පිළිසරණක් නැති'
(අ)මෙසේ පැවසීමට පෙර මේ පිළිබඳව සඳහන් කළ උපමා දෙකක් ලියන්න.
(ආ) මහෞෂධ පඬිතුමා රජු හමු වී ඉන් පසු ගත් ක්‍රියාමාර්ගය කෙටියෙන් දක්වන්න.

3. සැළලිහිණි සන්දේශයෙන් උපුටාගත් **'මගවිසිතුරු'** පැදි පෙළෙන්
(i)ස්වභාව සෞන්දර්ය මැනවින් වර්ණනා කිරීම'
(ii) එකල සමාජ ආර්ථික තොරතුරු දැක්වීම මැනවින් සිදු වී ඇත' එක් කොටසකට කවි දෙක බැගින් යොදා ගනිමින් මේ බව විමසන්න.

නැතහොත්

- වඩා සාර්ථක නවකතාවක් නිර්මාණය කිරීමෙහි ලා කතුවරයා,
(i)සංවාද භාවිතය
(ii)සංකේත හා සංකල්ප රූප මැවෙන පරිදි බස හැසිරවීම දැකිය හැක. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් **'බැද්දේගම'** නවකතාවේ ඔබට නියමිත කොටසින් මේ බව විමසන්න.

4. **'ගංගාවේ සංගීතය'** පැදි පෙළෙහි,

(i)ගැඹුරු ජීවන දර්ශනයත් ගෙනහැර පෑම

(ii) විවිධ කාව්‍යෝපක්‍රම භාවිතය දැකිය හැක. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ පිළිබඳ ව විමසන්න.

නැතහොත්

- ධර්මසේන හිමියෝ කතා කීමේ දක්ෂයෙකි.

(i)හාස්‍ය, අනුකම්පාව මතුවන පරිදි අවස්ථා නිරූපණය කිරීම,

(ii)අභියෝග ජය ගනිමින් අනාගතය ජය ගත හැකි බව පෙන්වීම **'උග්ගසේන සිටුපුත්තුගේ වස්තුව'** මගින් සිදුවේ.එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ බව විමසන්න.

5. **සිංහබාහු** නාට්‍යයේ, සිංහබාහුගේ චරිතයෙන් පිළිබිඹු වන්නේ නව යොවුන් වියේ තරුණයකුගේ හැසිරීම් ස්වරූපය යි. උදාහරණ අවස්ථා තුනක් යොදා ගනිමින් මේ පිළිබඳ විමසන්න.

6. ජන ජීවිතය වඩා යහපත් කිරීමට ජන කවියෙන් ලද හැකි පිටිවහල ඉතා විශාල ය. උදාහරණ කවි 3 ක් යොදාගනිමින් **'හානා හීය පානා අඬහැරෙන් දැනේ'** කවි පෙළෙන් මේ පිළිබඳව විමසන්න.

7. සිහින ලෝකය හා සැබෑ ලෝකය දෙකක් බව දක්වමින් පාඨකයා තුළට ජීවිතාවබෝධය ගෙනදීමට **'දියමන්ති මාලය'** කෙටි කතාවෙන් සුදුසු අවස්ථා තුනක් යොදා ගෙන මේ පිළිබඳව විමසන්න.